කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය - **2016**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ **108(1)** වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ **111** වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------------**

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම් වෙනුවෙන් වැය කළ රු. 29,148,559 ක් වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් වැයකළ ප්‍රාග්ධන ගිණුමට මාරු කළ යුතු වුවද රු.8,237,513 ක් පමණක් එම ගිණුමට මාරු කර තිබුණි. එබැවින් රු. 20,911,046 ක් තවදුරටත් වැය නොකළ ප්‍රාග්ධන ගිණුමේ පැවතුණි.**

**(ආ)** **මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදලින් ලද පොලී ආදායම රු. 2,169,816 ක් ලෙස දක්වා තිබුණද තත්‍ය වශයෙන්ම ලද මුදල රු. 2,137,360 ක් වූයෙන් රු. 32,456 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුල්‍යතාවය පිළිබඳ විගණනයේ දී ගැටළුකාරී විය.**

**(ඇ)** **ආයතනය සතු අක්කර 50 ක ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.**

**(ඇ)** **ආයතනය පිහිටි ඉඩම භාවිතයට ගැනීම පිළිබඳ සැලසුම් සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මොරටුව විශ්වවිද්‍යාලය වෙත රු. 1,600,000 ක මුදලක් ගෙවිය යුතු අතර ඒ වෙනුවෙන් වෙන් කිරීම් සිදුකර නොතිබුණි.**

**(ඉ)** **සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු පොලී ආදායම රු.2,162,150 ක් වුවද එය රු. 2,055,648 ක් ලෙස දක්වා තිබීමෙන් ජංගම වත්කම් රු.106,502 ක් අඩුවෙන් දක්වා තිබුණි.**

**2.2.2** **පැහැදිලි නොකළ වෙනස්කම්**

**-----------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා ඇති ආපදා ණය ශේෂය රු.217,640 ක් වුවත් ආපදා ණය ලේඛනය අනුව එම ශේෂය රු. 224,583 ක් වූයෙන් රු. 6,943 ක වෙනසක් නිරීක්ෂණය විය.**

(ආ) ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ ලබාදී ඇති ණය මුදලට අදාළව වර්ෂ අවසානයට ලැබිය යුතු පොලී ආදායම, ලේඛන අනුව රු.289,980 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.53,500 ක් වූයෙන් රු.236,480 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොග ශේෂය රු. 4,775,743 ක් වුවත් වර්ෂ අවසාන තොග සමීක්ෂණ වාර්තාව අනුව එම වටිනාකම රු. 4,294,217 ක් වූයෙන් රු. 481,526 ක වෙනසක් විය.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්
-----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී එම විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ආයතනය විසින් පවත්වන ලද විභාග 18 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 04 සිට මාස 19 දක්වා කාලයක් ගත කර තිබූ බව නිරීක්ෂණය විය. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 12 දෙනෙකු වෙත අවස්ථා 26 කදී එකතු වටිනාකම රු. 804,220 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| | | (ii) | අත්තිකාරම් ලබා දීමේදී නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව අවස්ථා 7 කදී එකතුව රු. 382,000 ක අත්තිකාරම් ලබාදී තිබුණු අතර එයින් සියයට 51 සිට සියයට 85 දක්වා ප්‍රමාණයක් මුදලින් ආපසු පියවා තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,828,494 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,991,049 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,819,543 කින් පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික සහ පාරිතෝෂික ප්‍රතිපාදන රු. 8,622,776 කින් වැඩිවීම සහ ක්‍රමක්ෂය රු. 9,014,133 කින් අඩුවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අතිරික්තය විචලනයන් සහිතව වර්ධනය වී තිබූ අතර 2016 වර්ෂයේ ඌනතාවයක් ඇති වී තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.8,197,837 ක් වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.34,603,218 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වුවද 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු.27,126,300 ක් දක්වා අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව ආයතනයේ ප්‍රධාන අරමුණ කෘෂිකර්ම හා කෘෂි තාක්ෂණයේ සහ ග්‍රාමීය විද්‍යා මූලිකාංග පිළිබඳ උසස් අධ්‍යාපනයේ දැනට යෙදී සිටින තැනැත්තන් සඳහා උසස් අධ්‍යාපනය ලබාදීම, ප්‍රවර්ධනය සහ වර්ධනය කිරීම විය.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>පටක රෝපණ කෙසෙල් පැල නිෂ්පාදනය</u>

2016 - 2020 සංයුක්ත සැලැස්මේ අරමුණක් ලෙස පටක රෝපණ කෙසෙල් පැල නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ආයතනයේ ආදායම ඉහළ නැංවීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම දක්වා තිබුණි. එහෙත් එම අරමුණු ලඟාකර ගැනීමට ආයතනය අපොහොසත් වී ඇති බව 2014, 2015 සහ 2016 වර්ෂයන්හි පැල සඳහා වූ ඉල්ලුම, නිෂ්පාදනය සහ අලෙවිය පිළිබඳ දත්ත පරීක්ෂාවේදී අනාවරණය විය.

(i) පැල සඳහා පවතින ඉල්ලුම වාර්ෂිකව විශාල ලෙස ඉහළ ගොස් තිබෙන අතර ඊට සාපේක්ෂව නිෂ්පාදනය ඉතා පහළ අගයක් ගෙන තිබුණි. මෙහිදී 2015 වර්ෂයේ සහ 2016 වර්ෂයේදී ඉල්ලුමට සාපේක්ෂව නිෂ්පාදනය පිළිවෙලින් සියයට 44 ක් හා සියයට 37.6 ක් වී තිබුණි. මේ හේතුව නිසා බොහෝ ගැණුම්කරුවන් සිය ඇණවුම් අවලංගු කර ගන්නා බවත් එම නිසා ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටු නොවන බවත්, ලබාගත හැකි ආදායම් අහිමිවන බවත් නිරීක්ෂණය විය.

(ii) පැල ඇණවුම් ලැබීම, නිකුත් කිරීම හා අලෙවි කිරීම සඳහා ලේඛන වෙන් වෙන් වශයෙන් තිබුණද එම ලේඛන අවිධිමත් ලෙස පවත්වාගෙන යාම හේතුවෙන් ලැබුණු ඇණවුම් අනුව පැල නිකුත් කරන ලද්දේද අවලංගු කර තිබේද හා ඉදිරි මාසවලදී නිකුත් කර තිබේද යන්න පැහැදිලිව විගණනයට හඳුනාගත නොහැකි විය.

(iii) පටක රෝපණ කෙසෙල් පැලයක නිෂ්පාදන වියදම 2016 වර්ෂයේදී රු. 40 දක්වා අඩුකර ගැනීමට අපේක්ෂා කර තිබුණද නිෂ්පාදන පිරිවැය රු. 71 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. තවද පැල විනාශ වීමේ අනුපාතය සියයට 1.5 දක්වා අඩුකර ගැනීමට අපේක්ෂා කර තිබුණද එම අගය සියයට 11.3 දක්වා වැඩි වී තිබුණි.

(ආ) 2016 – 2020 උපායශිලී හා කළමනාකරණ සැලැස්ම අනුව 2016 වර්ෂයේදී පැපොල් පැල අලෙවිය මඟින් රු. මිලියන 1.62 ක ආදායමක් ලබාගැනීමටත් අනෙකුත් පළතුරු අලෙවියෙන් රු. මිලියන 1.2 ක ආදායමක් ලබාගැනීමටත් සැලසුම් කර තිබුණද එම අරමුණ ළඟා කරගෙන නොතිබුණි. 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වර්ෂ 09 ක කාලයක් තිස්සේ ආයතනය කෙසෙල් පැල රෝපණය කිරීමේ ක්‍රියාවලියේ පමණක් නිරතව සිටින අතර වෙනත් කිසිදු බෝගයක පටක රෝපණය සඳහා අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2016 මාර්තු 21 දින ජීව ඉන්ධන භාවිතයෙන් ක්‍රියාකරන එළවළු හා පළතුරු වියලනයක් ආයතනය වෙත ලබාදී තිබු අතර සිසුන්ගේ අධ්‍යාපන කටයුතු, අදාල තාක්ෂණ දැනුම වර්ධනය, ආහාර නිෂ්පාදනය සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රය යටතේ කුඩා හා ග්‍රාමීය කර්මාන්තකරුවන් අතර මෙම ක්‍රමය ප්‍රචලිත කිරීම යන්ත්‍රය ලබාදීමේ අරමුණ විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වැඩසටහන් හා ක්‍රියාකාරකම් පිළිබඳව සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග දත්ත හා තොරතුරු හුවමාරු කරගැනීම සඳහා එකඟතා ගිවිසුමකට එළඹිය යුතු බවට අධිකාරියේ අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණද එවැනි ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු මෙම යන්ත්‍රයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර සුදුසු ස්ථානයක ස්ථාපිත නොකර ආයතනයේ රථගාලේ අනාරක්ෂිතව මෙම යන්ත්‍රය ස්ථාපිත කර තිබුණි.

(iii) ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පුහුණු වීම හැරුණු විට අනෙකුත් අරමුණු සඳහා ආයතනය විසින් මෙම යන්ත්‍රය යොදාගෙන නොතිබුණි.

(ඇ) කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා බඳවාගත් පළමු ශිෂ්‍ය කණ්ඩායමේ අධ්‍යයන කටයුතු 2009 වසරේ ආරම්භ කර තිබු අතර අවසන් විභාගය 2016 වසරේ පවත්වා තිබුණි. උපාධි පාඨමාලාව අදියර තුනකින් සමන්විත වන අතර පාඨමාලාව සඳහා පළමු කණ්ඩායම ලෙස ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයින් 60 දෙනෙකුගෙන් 26 දෙනෙකු පළමු අදියර සම්පූර්ණ කිරීමකින් තොරව පාඨමාලාව අතහැර ගොස් තිබුණි. සිසුන් 25 දෙනෙකු පමණක් උසස් ඩිප්ලෝමා අදියර සම්පූර්ණ කර තිබුණු අතර 09 දෙනෙකු පමණක් උපාධි අදියර සම්පූර්ණ කිරීමට සමත් වී තිබුණි. අධ්‍යයන කටයුතු සඳහා බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 85 ක ප්‍රමාණයක් අධ්‍යයන කටයුතු අතරමග අතහැර දැමීම පිළිබඳව ආයතනය විසින් පසු විපරම් කර සුදුසු විසඳුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් ගොවීන් තිදෙනෙකුට 2014 හා 2015 වර්ෂවල ලබාදී ඇති ණය මුදලින් රු. 301,570 ක හිඟ ණය වාරික හා ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (Rural Entrepreneurship Development) මඟින් ගොවීන් පස්දෙනෙකු වෙත 2012 හා 2014 වර්ෂවලදී ලබාදී තිබුණු ණය මුදලින් රු. 114,660 ක හිඟ ණය වාරික සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) අකුණු අනතුරු අවම කිරීම සඳහා 2015 වර්ෂයේදී රු. 2,746,292 ක මුදලක් වැයකර ඉදිකර තිබු ආරක්ෂණ පද්ධතිය (Lightning Projection system) අදාළ කොන්ත්‍රාත්කරු විසින් 2016 ජනවාරි 16 දින වැඩ නිමකර භාරදී තිබුණද එම පද්ධතියේ අඩුපාඩු පැවතීම හේතුවෙන් අදාළ රඳවුම් මුදල් නිදහස් කර නොතිබුණි. කෙසේ වුවද විගණිත දිනය වූ 2017 ජුනි 30 දින දක්වා එම අඩුපාඩු සම්පූර්ණ කර නොතිබුණු අතර මෙම පද්ධතිය සඳහා ලබාදී තිබු වගකීම් කාලයද අවසන් වී තිබුණි.

**4.3** කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 26 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය 05 ක් විය. ඒ අනුව සමස්ත කාර්ය මණ්ඩල ඌනතාවය 21 ක් වන අතර ඒ තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු 3 දෙනෙකුගේ සහ තාවකාලික ශිල්ප ප්‍රදර්ශක තනතුරු 04 ක (Temporary Demonstrators) ඌනතාවයක් පැවතුණි.

(ආ) ආයතනය විසින් කාර්ය පැවරුම් පදනම මත අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත පමණක් සේවකයන් 46 දෙනෙකු බඳවාගෙන තිබූ අතර එම බඳවා ගැනීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) ආයතනය සතුව කැබ් රථයක්, රෝද 02 ට්‍රැක්ටරයක් සහ රෝද 04 ට්‍රැක්ටරයක් පැවති අතර පවතින රියදුරු පුරප්පාඩු සඳහා ස්ථිර බඳවාගැනීම් සිදු නොකර කාර්ය පැවරුම් පදනම මත එක් රියදුරෙක් පමණක් බඳවාගෙන තිබුණි. කෙසේ වුවද පවතින රියදුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදුකිරීමට රියදුරු තනතුරු අනුමත කර නොමැති බව ආයතනය විසින් දන්වා තිබුණි.

**4.4** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේ රු.220,096,952 ක් වැයකර 2014 වර්ෂයේදී කාමර 100 කින් සමන්විත සිසුන් 400 කට නේවාසික පහසුකම් ලබාගත හැකි නේවාසිකාගාරයක් ආයතනය තුළ ඉදිකර තිබුණ ද එහි කාමර 45 ක් සඳහා පමණක් අවශ්‍ය ගෘහභාණ්ඩ සපයා තිබුණි. තවද මෙම නේවාසිකාගාරයේ පූර්ණ කාලීනව නේවාසිකව සිටින සිසුන් නොමැති බවත් විභාග, ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වෙන දිනවලදී පමණක් සිසුන් නවාතැන් පහසුකම් ලබාගන්නා බවත් නිරීක්ෂණය විය.

(ආ) ආයතනය පිහිටි අක්කර 50 ක ඉඩමෙන් අක්කර 40 ක මුඩු ඉඩම භාවිතයට ගන්නා ආකාරය දක්වමින් සැලසුම් සකස් කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහ නිර්මාණ ශිල්ප පීඨයේ උපදේශක අංශය සමඟ 2016 ඔක්තෝබර් 20 දින ගිවිසුම්ගතව රු.1,600,000 ක් ගෙවීමට එකඟ වී, ප්‍රමුඛතා සැලැස්මක් සකස් කර තිබුණ ද සමාජයට ආදර්ශයක් වන ලෙස කෘෂිකාර්මික වගාවන්ගෙන් යුක්ත වන පරිදි ඉඩම සකස් කිරීම කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණු අතර මෙම ඉඩම කිසිදු ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා ද යොදාගෙන නොතිබුණි.

(ඇ) ආයතනයේ පරිගණක පරීක්ෂණාගාරය වෙත 2014 වර්ෂයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ පරිගණක 35 න් පරිගණක 14 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණු අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනයෙහි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ අරමුණ වෙනුවෙන් රු. 1,400,000 ක මුදලක් වෙන් කර තිබුණද ඒ සම්බන්ධ කිසිදු කාර්යයක් වර්ෂය තුළ ඉටු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ආයතනය සතු ඉඩම ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා යොදා නොගැනීම, වත්කම් ලේඛන පැහැදිලිව වර්ගීකරණය නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කර නොගැනීම සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ණය පාලනය | ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |